# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2011 අංක 32 දරන නාවික හමුදා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 ජුනි මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 ජුනි මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 2.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2011 අංක 32 දරන නාවික හමුදා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 ජුනි මස 24 වන දින]

එල්.ඩී.—ඕ. 30/2010.

**(358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2011 අංක 32 දරන නාවික හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 28 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ:— (358 වන අධිකාරිය වූ) නාවික හමුදා පනතේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

"වැරදිකරුවන් පිළිබඳ ලඝු නඩු විභාගය

28. (1) නාවික හමුදාපතිවරයා විසින් :—

(අ) යුද්ධාධිකරණයක් විසින් විභාග කළ යුතු බවට මේ පනත මගින් ප්‍රකාශිතවම නියම කර ඇති වරදක් හැර වෙනත් වරදකට අදාළ වන අවස්ථාවක දී ;

(ආ) ලුතිනන් කමාන්ඩර් හෝ එම නිලයට වඩා අඩු නිලයක් දරන නිලධරයකු විසින් කරන ලද ඔහුට එරෙහිව මරණීය දඬුවම ලබාදිය නොහැකි වරදකට චෝදනා කරනු ලබන අවස්ථාවක දී ; සහ

(ඇ) ඔහුගේ මතය අනුව සිදුකර ඇති වරදේ ස්වභාවය අනුව යුද්ධාධිකරණය විසින් විභාග කිරීම අවශ්‍ය නොවන විට ;

චූදිතයාට එරෙහිව ලඝු කාර්ය පටිපාටිය අනුව නඩු විභාග කිරීම සඳහා කපිතාන්වරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක නිලධරයකුට ඔහු විසින් බලය පවරනු ලැබිය හැකි ය.

එසේ වුව ද නඩු විභාගය ආරම්භ කිරීමට පෙර චූදිත තැනැත්තා වඩා කැමති වනුයේ —

(i) යුද්ධාධිකරණයක් විසින් ඔහුගේ නඩුව විභාග කිරීම සඳහා ද ; නැතහොත්

(ii) ලඝු කාර්ය පටිපාටිය අනුව ඔහුගේ නඩුව විභාග කිරීම සඳහා ද,

යන්න නඩු විභාගය පැවැත්වීමට බලය පවරා ඇති නිලධරයා විසින් චූදිතයාගෙන් විමසිය යුතු ය.

එසේම නඩු විභාගය යුද්ධාධිකරණයක් විසින් විභාග කළ යුතු බවට චූදිතයා විසින් කැමැත්ත පළ කළහොත් චූදිත තැනැත්තාට එරෙහිව යුද්ධාධිකරණයක් මගින් නඩුව විභාග කිරීම සඳහා පියවර ගත යුතු ය.

එසේම තවදුරටත් ලඝු කාර්ය පටිපාටිය අනුව වරදක් විභාග කරන නිලධරයකුගේ දඬුවම් කිරීමේ බලතල ජ්‍යෙෂ්ඨතාවය අහිමි කිරීමට හෝ දඬුවම් ලැයිස්තුවේ බරපතලකම අඩු වෙනත් දඬුවමකට සීමා විය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.